# 5 පටිච්චසමුප්පාදය

පටිච්චසමුප්පාදය හැඳින්වීමට අපි හේතුඵල දහම යන නම ද භාවිත කරමු. හේතුඵල දහම් යනු යම් කිසි හේතුවක් මුල්කර ගෙන ඵලයක් ඇති වීම සහ එම හේතුව නැති විට ඵලය ද නැති වීම යන්න යි. මෙම ධර්මතාව ලෝකයේ සැමකල්හි ම පවතින්නකි. එහෙත් මෙය අවබෝධ කරගැනීමට අපහසු නිසා සත්ත්වයා යළි යළිත් ඉපදෙමින් මැරෙමින් සසර ගමන් කරන බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක.

සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වී පළමු සතිය අවසානයේ පටිච්චසමුප්පාදය අග සිට මුලටත් මුල සිට අගටත් හෙවත් අනුලෝම පටිලෝම වශයෙන් මෙනෙහි කළ බව සඳහන් වේ. සමස්ත බුද්ධ ධර්මය ම මෙම පටිච්චසමුප්පාදය තුළ අන්තර්ගත කළ හැකි බව බුදුරජාණන් වහන්සේ විසින් ම පෙන්වා දී ඇත.

යො පටිච්චසමුප්පාදං පස්සති
සො ධම්මං පස්සති,
යො ධම්මං පස්සති
සො පටිච්චසමුප්පාදං පස්සති.

යමෙක් පටිච්චසමුප්පාදය දකියි ද
හෙතෙම ධර්මය දකියි.
යමෙක් ධර්මය දකියි ද
හෙතෙම පටිච්චසමුප්පාදය දකියි.

ලොව හැම දෙයක් ම ඇති වීමට හේතුවක් ඇත. එම හේතුව නැති වීම තුළින් ඵලය නැති වී යයි. බීජයක් ඇති විට ඉන් පැළයක් ඇති වේ. බීජයක් නොමැති නම් පැළය ද ඇති නො වේ. මේ ආකාරයට ලෝකයේ සත්ත්වයා ඉපිද මිය යන ආකාරය විග්‍රහ කිරීම සඳහා පටිච්චසමුප්පාද ධර්මය හෙවත් හේතුඵල ධර්මය ඉදිරිපත් කරන ලදී. එහි දී පටිච්චසමුප්පාද කෙටි සූත්‍රය මෙසේ දැක්විය හැකි ය.

- ඉමස්මිං සති ඉදං හොති
- මෙය ඇති කල්හි මෙය වේ.
- ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති
- මෙය හට ගැනීමෙන් මෙය හට ගනී.
- ඉමස්මිං අසති ඉදං න හොති
- මෙය නැති කල්හි මෙය නො වේ.
- ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති
- මෙය නැති වීමෙන් මෙය නැති වේ.

මෙම පටිච්චසමුප්පාද ධර්මය බැලූ බැල්මට ඉතා පහසු, සරල ධර්මයක් බව පෙනේ. එහෙත් එය ඉතා සරල ධර්මයක් නො වන බව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට ඇත.

දිනක් ආනන්ද හිමියන් පවසන්නේ "බුදුරජාණන් වහන්ස, මේ පටිච්චසමුප්පාදය ඉතා පහසුවෙන් මට වැටහෙයි. ඉතා පැහැදිලි ව පෙනෙයි '' කියායි. මෙයට පිළිවදන් දෙන බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළහ.

''ආනන්දය එසේ නො කියන්න. මෙම පටිච්චසමුප්පාද ධර්මය ඉතා ගැඹුරු ය. මෙය හරියාකාර ව අවබෝධ කර ගැනීමට නොහැකි ව ප්‍රශ්නවල පැටලුන සත්ත්වයෝ සසර අතරමං වෙති. අපායේ පවා උපත ලබති.''

සත්ත්වයා සසර දුක් විඳින්නේ ඊට හේතු ඇති බැවිනි. එම හේතු නැති කළ විට සසර දුක ද නැති වේ.

ඉහත කී පටිච්චසමුප්පාදය හෙවත් හේතුඵල දහම අනුලෝම වශයෙන් හා පටිලෝම වශයෙන් විවරණය කළ හැකි ය.


අපි පළමු ව අනුලෝම පටිච්චසමුප්පාදය විමසා බලමු.

| | |
|---|---|
| අවිජ්ජා පච්චයා සංඛාරා | අවිද්‍යාව හෙවත් චතුරාර්ය සත්‍යය නොදැනීම ඇති කල සංස්කාර ඇති වේ. |
| සංඛාර පච්චයා විඤ්ඤාණං | සංස්කාර හෙවත් කුසලාකුසල රැස්කිරීම ඇති කල විඤ්ඤාණය ඇති වේ. |
| විඤ්ඤාණ පච්චයා නාමරූපං | විඤ්ඤාණය හෙවත් ප්‍රතිසන්ධි සිත ඇති කල නාමරූප ඇති වේ. |
| නාමරූප පච්චයා සළායතනං | නාමරූප ඇති කල ආයතන සයක් ඇති වේ. |
| සළායතන පච්චයා ඵස්සෝ | සළායතන හෙවත් ඉන්ද්‍රිය සය ඇති කල ස්පර්ශය ඇති වේ. |
| ඵස්ස පච්චයා වේදනා | ස්පර්ශය හෙවත් ඉන්ද්‍රිය ඒ ඒ අරමුණු සමග හැපීම් ඇති කල වේදනාව ඇති වේ. |
| වේදනා පච්චයා තණ්හා | වේදනාව හෙවත් වින්දනය ඇති කල තණ්හාව ඇති වේ. |
| තණ්හා පච්චයා උපාදානං | තණ්හාව හෙවත් ආශාව ඇති කල උපාදානය ඇති වේ. |
| උපාදන පච්චයා භවෝ | උපාදානය හෙවත් සිතින් දැඩි ව අල්ලාගැනීම ඇති කල භවය ඇති වේ. |
| භව පච්චයා ජාති | භවය හෙවත් සසර පැවැත්මට අදාළ කර්ම ඇති කල ජාතිය ඇති වේ. |
| ජාති පච්චයා ජරා මරණ පරිදේව දුක්ඛ දෝමනස්සුපායාසා සම්භවන්ති. | ජාතිය හෙවත් උපත ඇති කල ජරා සෝක මරණාදී දුක් ඇති වේ. |

ඉහත සඳහන් වන්නේ සසර දුක හට ගන්නා අනුලෝම හේතුඵල ධර්මතාව යි. එසේ ම හේතු නැති කිරීම තුළින් දුක් නැති කිරීමට හැකි බව බුදුදහම උගන්වයි. ඒ අනුව මෙම පටිච්චසමුප්පාදය පටිලෝම ලෙසින් ක්‍රියාත්මක වන ආකාරය විමසා බලමු.

| | |
|---|---|
| අවිජ්ජායත්වේ ව අසේස විරාග නිරෝධා සංඛාර නිරෝධො | අවිද්‍යාව නැති වීමෙන් සංස්කාර නැති වේ. |
| සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධො | සංස්කාර නැති වීමෙන් විඤ්ඤාණය නැති වේ. |
| විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරෝධො | විඤ්ඤාණය නැති වීමෙන් නාමරූප නැති වේ. |
| නාමරූප නිරෝධා සළායතන නිරෝධො | නාමරූප නැති වීමෙන් සළායතන නැති වේ. |
| සළායතන නිරෝධා ඵස්ස නිරෝධො | සළායතන නැති වීමෙන් ස්පර්ශය නැති වේ. |
| ඵස්ස නිරෝධා වේදනා නිරෝධො | ස්පර්ශය නැති වීමෙන් වේදනාව නැති වේ. |
| වේදනා නිරෝධා තණ්හා නිරෝධො | වේදනාව නැති වීමෙන් තණ්හාව නැති වේ. |
| තණ්හා නිරෝධා උපාදාන නිරෝධො | තණ්හාව නැති වීමෙන් උපාදානය නැති වේ. |
| උපාදාන නිරෝධා භව නිරෝධො | උපාදානය නැති වීමෙන් භවය නැති වේ. |
| භව නිරෝධා ජාති නිරෝධො | භවය නැති වීමෙන් ඉපදීම නැති වේ. |
| ජාති නිරෝධා ජරා මරණං, සෝක පරිදේව දුක්ඛ දෝමනස්සුපායාසා නිරුජ්ඣන්ති. | ඉපදීම නැති වීමෙන් වයසට යාම, මරණය, සෝකය, පරිදේවය, දුක, දොම්නස් උපායාස සියල්ල නැති වේ. |

## පටිච්චසමුප්පාදය චක්‍රයක් ආකාරයට




ඉහතින් දක්වන ලද පටිච්චසමුප්පාදය අපට චක්‍රයක් ලෙස පෙනේ. එහි ගරාදි 12 කි. චක්‍රයක ගරාදි එක දෙක ආදි වශයෙන් වෙන් කළ නො හැක්කාක් මෙන් ම මෙහි ද පළමු කරුණ, දෙවන කරුණ ලෙස වෙන් කළ නොහැකි ය. මෙහි දී අපගේ අවබෝධයේ පහසුව පිණිස අවිද්‍යාවෙන් පටන් ගෙන ඇත. චක්‍රයකට මුලක්, මැදක්, අගක් නැත. පටිච්චසමුප්පාද චක්‍රය ද එසේ ය.

මෙම හේතුඵල දහම හෙවත් පටිච්චසමුප්පාදය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් සංසාර දුක් ඇති වන හා නැති වන ආකාරය පෙන්වා දීමට මෙන් ම සමාජගත දුක ඇති වන හා නැති වන ආකාරය පෙන්වා දීමට ද යොදාගෙන තිබේ.

අපි අද සමාජයේ පවතින දිළිඳුකම, නූගත්කම, අසමගිය, සමාජ විසමතා, ජාතිවාදී අරගල ආදී සමාජ ගැටලු ගැන නිතර කතා කරමු. මේවාට පිළියම් සොයමු. එහෙත් මෙහි දී අපට බොහෝ විට පෙනී යන්නේ එසේ ලබා දෙන විසඳුම් බොහොමයක් අසාර්ථක වන බවයි. මෙහි ඇති ගැටලුව නම් එම සමාජ ප්‍රශ්නවලට තුඩු දී ඇති මූලික හේතු අමතක කර විසඳුම් සෙවීමයි.

ලොව සමාජ ගැටලු ඇති වන හා නැති වන අයුරු මෙම හේතුඵල න්‍යායට අනුව ම බුදුරජාණන් වහන්සේ විසින් බොහෝ සූත්‍ර ධර්මයන්හි පෙන්වා දී ඇත. දිළින්දන්ට ධනෝපායන මාර්ග නොමැති නිසා විවිධ සමාජ ප්‍රශ්න ඇති වන අයුරු චක්කවත්තිසීහනාද සූත්‍රය පටිච්චසමුප්පාද න්‍යායට අනුව පෙන්වා දෙයි.

''මහණෙනි, මෙසේ දුප්පතුන්ට ධනය නොදෙන කල්හි දිළිඳුකම වැඩි විය. දිළිඳුකම වැඩි වීම නිසා සොරකම වැඩි විය. සොරකම නිසා අවි ආයුධ බහුල විය. අවි ආයුධ බහුල නිසා ප්‍රාණඝාතය ඇති විය. ප්‍රාණඝාතය නිසා බොරු කීම හා කේලාම් කීම ඇති විය. බොරු කීම හා කේලාම් කීම නිසා අනිසි කාමසේවනය ඇති විය. අනිසි කාමසේවනය නිසා රළුවචන හා හිස්වචන ඇති විය. රළුවචන හා හිස්වචන නිසා මිථ්‍යාදෘෂ්ටිය ඇති විය. මිථ්‍යාදෘෂ්ටිය නිසා අධර්මයෙහි ඇල්ම, විසමලෝභය හා මිථ්‍යා ධර්මය ඇති විය. එම කරුණු නිසා මව්පියන්ට ගරු නොකරන පැවිද්දන්ට නොසලකන, කුලදෙටුවන් නොපුදන අදැහැමි සමාජයක් ඇති විය.''

එසේ ම තණ්හාව මුල්කොට ගෙන කලකෝලාහල ආදිය ඇති වන අයුරු මහා නිදාන සූත්‍රයේ දී ද පටිච්චසමුප්පාද න්‍යාය අනුව පෙන්වා දී ඇත. අනුලෝම පටිච්ච සමුප්පාද න්‍යාය මෙහි දී භාවිත වී ඇති අයුරු විමසා බලමු.

වේදනාව නිසා තණ්හාව ඇති වේ. තණ්හාව නිසා රූපාදී අරමුණු සොයයි. සෙවීම නිසා ලැබීම සිදු වේ. ලැබීම නිසා හොඳ නරක විනිශ්චය කරයි. විනිශ්චය නිසා ඡන්දරාගය ඇති වේ. ඡන්දරාගය නිසා මමත්වය ඇති වේ. මමත්වය නිසා මසුරුකම ඇති වේ. මසුරුකම නිසා ආරක්ෂා කිරීම ඇති වේ. ආරක්ෂා කිරීම ඇති නිසා දඬු මුගුරු දැරීම, අවි දැරීම, කලකෝලාහල, විවාද, අනුම් බැණුම්, කේලාම්, බොරුකීම් ආදි නොයෙක් ළාමක අකුසල ධර්මයෝ ඇති වෙති.

මෙසේ ලොව ඇති වන සමාජ ගැටලු අනුලෝම පටිච්චසමුප්පාදය අනුව පෙන්වා දිය හැකිවාක් මෙන් ම, එම ගැටලු නිරාකරණය ද පටිලෝම පටිච්චසමුප්පාදය අනුව පෙන්වා දිය හැකි ය. එහි දී සිදුවන්නේ හේතුව නැති කිරීම තුළින් ඵලය නැති වන අයුරු පෙන්වා දීම යි.

මෙසේ දිළින්දන්ට ධනය ලැබීමෙන් දිළිඳුකම නැති වේ. දිළිඳුකම නැති විට සොරකම නැති වේ. සොරකම නැති විට අවි ආයුධ අවශ්‍ය නො වේ. අවි ආයුධ නැති විට ප්‍රාණඝාතය සිදු නොවේ. ප්‍රාණඝාතය නැති විට බොරුව, කේලම නැති වේ. බොරු කීම්, කේලාම් කීම් නැති විට අනිසි කාමසේවනය නැති වේ. අනිසි කාමසේවනය නැති විට රළු වචන හා හිස් වචන නැති වේ. රළු වචන හා හිස් වචන නැති විට මිථ්‍යාදෘෂ්ටිය නැති වේ. මිථ්‍යාදෘෂ්ටිය නැති විට අධර්මයෙහි ඇල්ම, විසමලෝභය හා මිථ්‍යාධර්මය නැති වේ. අධර්මයෙහි ඇල්ම, විසමලෝභය, මිථ්‍යා ධර්මය නැති විට මව්පියන්ට ගරුකරන, පැවිද්දන්ට සලකන, කුලදෙටුවන් පුදන දැහැමි සමාජයක් ඇති වේ.

ඉහත සඳහන් ආකාරයට විවිධ ප්‍රශ්න ඇති වන හා නැති වන ආකාරය පටිච්ච සමුප්පාද න්‍යායට අනුව විමසා පිළියම් යෙදිය හැකි ය.

ඉගෙන ගන්නා දරුවන් ලෙස අප මුහුණ පාන ගැටලු දෙස බුද්ධිමත් ව බැලීමට පුරුදු වෙමු. යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වූ විට එයට හේතු වූ කරුණු මොනවා ද, එය නැති කළ හැක්කේ කෙසේ ද ? යනාදිය පිළිබඳ විමසා බැලීමට මෙම පටිච්චසමුප්පාද ධර්මය අපට සම්බන්ධ කර ගත හැකි ය.

## සාරාංශය

යම්කිසි හේතුවක් මුල්කර ගෙන ඵලයක් ඇතිවන ආකාරයත්, හේතුව නැතිකිරීම තුළින් ඵලය නැතිවීමත් පටිච්චසමුප්පාදය තුළින් පෙන්වා දෙයි. බුද්ධ ධර්මය හා පටිච්චසමුප්පාද ධර්මය යනු දෙකක් නො ව එකක් ම බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත. සංසාරගත දුක ඇති වන හා නැති වන ආකාරය මෙන් ම සමාජගත දුක් ඇති වන හා නැති වන ආකාරය ද පටිච්චසමුප්පාද න්‍යාය අනුව බුදුදහමේ පෙන්වා දී තිබේ. මෙය අපට ගැටලු විග්‍රහයේ දී මෙන් ම ඒවා විසඳීමේ දී ද ආදර්ශ කොට ගත හැකි ය.

## ක්‍රියාකාරකම්

01. පටිච්චසමුප්පාද කෙටි සූත්‍රය හා තේරුම මතකයෙන් කියන්න.

02. අවිජ්ජා පච්චයා ආදී පටිච්චසමුප්පාද දේශනාව අනුලෝම හා පටිලෝම ලෙස වෙන වෙන ම ලියන්න.

03. ගැටලු විසඳා ගැනීමේ දී පටිච්චසමුප්පාද න්‍යාය භාවිත කළ හැකි අයුරු නිදසුන් සහිත ව පෙන්වා දෙන්න.

## පැවරුම

01. ද්වාදසංග පටිච්චසමුප්පාදයේ අනුලෝම හා පටිලෝම යන ක්‍රම දෙක ම කටපාඩම් කරගන්න.

නරක සිතකින් නම්
හොඳක් නොකළැකි කිසියම්
හොඳක් නොකළේ නම්
උපන් ගතියෙන් නැත එලක් නම්

සිරිත් මල්දම